**ස්ථානය - යටියන්තොට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව** **දිනය - 2022.12.27** **වේලාව - පෙ.ව.9.00**

**සහභාගි වූ ගරු මහජන නියෝජිතයින්**

1.ගරු සභාපති - කේ.ඩී.වසන්ත මැතිතුමා
2.ගරු උප සභාපති - ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී**

3. ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා
4. කේ.ජී.සුමනතිස්ස ජයතිලක මැතිතුමා
5 ජී.මී.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා
6. ආර්.එම්.එස්.ඩබ්ලිව්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
7. ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා
8. ඩබ්ලිව් .කතිකා දමයන්ති මැතිනිය
9. කේ.කේ.නිමල් විජේසූරිය මැතිතුමා
10 .එන්.කේ.නිමල් කුමාරසිරි මැතිතුමා
11. ඒ.ජී.තිලකරත්න මැතිතුමා
12.ඩී.ඒ.සුනිල් දෙයියාගල මැතිතුමා
13.එම්.ඩබ්.හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා
14.එච්.ශාන්ත කුමාර හෙට්ටිකන්ද මැතිතුමා
15.ඩී.පි.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
16.ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා
17.ඩබ්.ජී.සරත් ප්‍රේමසිරි මැතිතුමා
18.එස්.සුදර්ශන් මැතිතුමා
19.එච්.ඒ.දිල්සානි ප්‍රශාදිකා මැතිනිය
20.කේ.මධුෂිකා ප්‍රශාදිනි මැතිනිය.
21.එම්.ඩී.ඥානවති මැතිනිය
22.ටී.ඉමල්කා සංජීවනි මැතිනිය
23.බී.සීතා රංජනි මැතිනිය
24.ඒ.පී.ඩබ්ලිව්.එම්.ඩයනා උදයංගනි මැතිනිය
25.එච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා
26.කේ.කමල්රාජ් මැතිතුමා

**සහභාගි වූ නිලධාරින්**

1.ලේකම් - දුමින්ද සී.වික්‍රමසිංහ මහතා
2.සංවර්ධන නිලධාරි - ආර්.එච්.සී.නිසාන්ති සෙනවිරත්න මිය

**ගරු මහ සභාවට නොපැමිණි මන්ත්‍රිවරුන්ගේ නාම ලේඛනය**

01.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.පී.ජී.ඩබ්.කීර්තිසේන අල්විස් මැතිතුමා
02.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා - පී.ඩබ්.අමිල හේමන්ත මැතිතුමා

ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැමිණි සිටි සියළුදෙනා ආගම සිහි කිරිමෙන් අනතුරුව ජාතික ගීය හා පළාත් පාලන ගීය ගායනයෙන් හා මියගිය රණවිරුවන් හට හා සභිකයින් ලෙස කටයුතු කර මිය ගිය මන්ත්‍රීතුමන්ලා හට ,කාර්යය මණ්ඩලයට ගෞරව කිරිමෙන් පසු සභාවේ කටයුතු පෙරවරු 9.00 ආරම්භ කරන ලදී.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

අද දින පැවැත්වෙන මහ සභා රැස්වීම සඳහා සහභාගි වි සිටින ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලා ,කාර්යය මණ්ඩලය ගෞරවයෙන් සෙනෙහසින් යුතුව පිළිගනු ලබනවා.ප්‍රියන්ත මන්ත්‍රීතුමත් අසනීප තත්වයෙන් වුනත් මේ සභාවට පැමිණිලා තියනවා. එතුමාවත් අපි ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා. විශේෂයෙන්ම මම මේ අවුරුදු 05 තුළම ගැටළුවකින් තොරව සහෝදර බැඳීමෙන් කටයුතු කිරිමට උදව් කරා.ඒ වගේම මේ ආයතනයේ සේවය කරන නිලධාරින් අපට ගැටළුවකින් තොරව වැඩ කටයුතු කරගෙන යාමට ශක්තියක් වුණා. 2023 වර්ෂයේදීත් මේ සියළු කාරණාවලට මැදිහත්වෙලා සභාවේ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා ඔබතුමන්ලාගේ නොමඳ සහයෝගය ලබාදෙන ලෙස කාරුණිකව දන්වමි.

**(අ) පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කිරිම**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.11.22 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව මා විසින් ඔබ වෙත එවා ඇති අතර ඔබ සියළු දෙනා විසින් එය කියවූවා සේ සලකා එහි කිසියම් නිවැරදි කිරිම් හෝ සංශෝධන නොමැති නම් වාර්තා කර ඇති පරිදි ස්ථිර කරන ලෙසට හා නිවැරදි කිරිම් හෝ සංශෝධන ඇත්නම් එය සංශෝධනය කරන ලෙසත් සභාවට මා දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු මහ සභාවට ඉදිරිපත් කරන ලද 2022.11.22 වන දින පැවැති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත කිරිම සුදුසු බව මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** 2022.11.22 වන දින පැවති මහ සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වූ බව ගරු මහ සභාවට නිවේදනය කර සිටිනවා.

**(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන** පුරනැගුම භූමියේ සති පොළේ 2022.12.07 දින අනවසර ඉදිකිරීමක් ලෙස අවදානම් අත්තිවාරමක් හා ඒ මත කණු 4ක් යොදා ඉදිකිරීම් සූදානමක් තිබූ අතර එම ඉදිකිරීම ඉවත්කිරිම 2012.12.08 දින සිදුකළ බව ගරු මහා සභාවේ දැනගැනීම සඳහා නිවේදනය කරමි.

**(ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම**
**(ඈ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත**
**(ඉ) කල් දී ඇති යෝජනාව**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 01.** 2023 වර්ෂයේ සෑම මාසයකම ගරු මහා සභාව හතරවන අගහරුවාදා දින පැවැත්වීම සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, 2023 වර්ෂයේ සෑම මසකම දෙවන සතියේ අඟහරුවාදා දින පැවැත්වීමටත් එදින නිවාඩු දිනයක් වුවහොත් එම දිනට පසු දිනයේ පැවැත්වීමටත් සුදුසුයැයි (ඉ) 01 යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා** ගරු සභාපතිතුමනි , 2023 වර්ෂයේ මහ සභාව දෙවන සතියේ අඟහරුවාදා දින පවත්වමු.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව , 2023 වර්ෂයේ සෑම මසකම දෙවන සතියේ අඟහරුවාදා දින පැවැත්වීමටත් එදින නිවාඩු දිනයක් වුවහොත් එම දිනට පසු දිනයේ පැවැත්වීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් , 2023 වර්ෂයේ සෑම මසකම දෙවන සතියේ අඟහරුවාදා දින පැවැත්වීමටත් එදින නිවාඩු දිනයක් වුවහොත් එම දිනට පසු දිනයේ පැවැත්වීමටත් ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 01)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 02. 2023 වර්ෂයේ දී ප්‍රාදේශීය සභා අරමුදලට අදාලව කළයුතු වියදමක් සම්බන්ධයෙන් වන විට හා එකී වියදම් පුනරාවර්ථන වියදම් වන විට දී එක් ලිත්මාසයක් තුළ සමුච්චිත වටිනාකම රු.500,000.00 දක්වා වන වියදම් සඳහා ද එකී වියදම් වන විට දී එක් ලිත් මාසයක සමුච්චිත වටිනාකම රු.300,000.00 ක් දක්වා වන වියදම් සඳහා ද ,බලය දීම සඳහා යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමාට ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තිය යටතේ සඳහන් විධි විධාන ප්‍රකාරව අධිකාරිය ලබා දීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 02)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 03. 2023 වර්ෂයේ දී ප්‍රාදේශීය සභා අරමුදලට අදාළව කළයුතු වියදමක් සම්බන්ධයෙන් එකී වියදම් පුනරාවර්ථන වියදම් වන විට දී එක් ලිත් මාසයක් තුළ සමුච්චිත වටිනාකම රු.1,500,000.00 දක්වා වන වියදම් සඳහා ද එකී වියදම් ප්‍රාග්ධන වියදම් වනවිට දී එක් ලිත් මාසයක සමුච්චිත වටිනාකම රු.1,000,000.00 ක් දක්වා වන වියදම් සඳහා ගෙවීම් අනුමත කිරිමට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමාට ප්‍රාදේශීය සභා පනතේ 216 වගන්තිය යටතේ සඳහන් විධි විධාන ප්‍රකාරව අධිකාරිය ලබා දීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 03)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 04. 2023 වර්ෂය සඳහා යටියන්තොට ප්‍රාදේශිය සභාවේ මුදල් හා ප්‍රතිපත්ති , නිවාස හා ප්‍රජා සංවර්ධනය ,කාර්මික සේවා සහ පරිසර පහසුකම් යන විෂයන් සම්බන්ධයෙන් සභාවේ මූල්‍ය ප්‍රතිපත්ති තීරණය කිරිමට හා සභා

අරමුදල් සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් ලබා දීම ,ආදායම් අය කිරීමට අදාල උපදෙස් ලබා දීම ඇතුළු ඊට අනුශාංගික කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සභාවට උපදෙස් දීම ,නිර්දේශ ලබා දීම හා යටියන්තොට ප්‍රාදේශීය සභාවේ බලතල කාර්යය කර්තව්‍ය ඉටු කිරීමේ දී සභාව විසින් පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කාරක සභාවන් පත් කිරීම සඳහා මා යෝජනා කරනවා.

01. මුදල් හා ප්‍රතිපත්ති කමිටුව
02. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව
03. කාර්මික සේවා කමිටුව
04. පරිසර පහසුකම් කමිටුව

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා. ඒ අනුව,

**01. මුදල් හා ප්‍රතිපත්ති කමිටුව**

I ගරු ප්‍රා.ස.මන්ත්‍රී කේ.ජී.එස් ජයතිලක මැතිතුමා
Ii. ගරු ප්‍රා.ස.මන්ත්‍රී ලාල් නිශාන්ත මැතිතුමා
Iii.ගරු ප්‍රා.ස.මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා
iv.ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි ටී.ඉමල්කා සංජීවනි මැතිනිය
v .ගරු ප්‍රා.ස.මන්ත්‍රී ප්‍රේමසිරි ජයලත් මැතිතුමා
vi.ලේකම්තුමා,විෂය නිලධාරීන්

**02. නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව**

I ගරු ප්‍රා.ස.මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා
Ii.ගරු ප්‍රා.ස.මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා
Iii.ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි සීතා රංජනි මැතිනිය
iv.ගරු ප්‍රා.ස.මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා
v.ගරු ප්‍රා.ස.මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා
vi.ලේකම්තුමා ,විෂය නිලධාරී

**03. කාර්මික සේවා කමිටුව**

I ගරු ප්‍රා.ස.මන්ත්‍රී ශාන්ත හෙට්ටිකන්ද මැතිතුමා
Ii. ගරු ප්‍රා.ස.මන්ත්‍රී හිමන්ත අජිත් මැතිතුමා
Iii.ගරු ප්‍රා.ස.මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා
iv.ගරු ප්‍රා.ස.මන්ත්‍රී කමල්රාජ් මැතිතුමා
v .ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි ඩයනා පාලමකුඹුර මැතිනිය
vi.ලේකම්තුමා,විෂය නිලධාරී,කාර්මික නිලධාරී

**04. පරිසර පහසුකම් කමිටුව**

I ගරු ප්‍රා.ස.මන්ත්‍රී ලාල් නිශාන්ත මැතිතුමා
Ii.ගරු ප්‍රා.ස.මන්ත්‍රී සුදර්ශන් මැතිතුමා
Iii.ගරු ප්‍රා.ස.මන්ත්‍රී සරත් ප්‍රේමසිරි මැතිතුමා
iv.ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි කතිකා දමයන්ති මැතිනිය
v.ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි ඩී.පී.ඥානවති මැතිනිය
vi.ලේකම්තුමා ,විෂය නිලධාරී

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඉහත නම් කරන ලද කමිටුව සුදුසුයැයි මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 04 යෝජනාවට අනුව ඉහත නම් කරන ලද කමිටු සාමාජිකයින් නම් කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 04)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 05. 2023 වර්ෂයේ කමිටු පැවැත්වෙන දින සඳහා පහත සඳහන් අයුරින් කාල සටහනක් සකසා ඇත.නමුත් මෙය අවශ්‍යතාවය මත සිදු කරනු ලබන අතර ඉතා හදිසි කාරණා වලදී කමිටු කැඳවීම කාල සටහනට බැහැරින් සිදු කරනු ලබයි.එම කාල සටහන සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

| | |
|---|---|
| 1. කාරක සභා කමිටුව | - සෑම මසකම පළමු සතියේ සිකුරාදා |
| 2. ප්‍රසම්පාදන කමිටුව | - සෑම මසකම දෙවන සතියේ සිකුරාදා සහ සිව්වන සතියේ බ්‍රහස්පතින්දා |
| 3. තාක්ෂණික කමිටුව | - සෑම මසකම දෙවන සතියේ බ්‍රහස්පතින්දා සහ සිව්වන සතියේ අඟහරුවාදා |
| 4.පුස්තකාල උපදේශන කමිටුව | - සෑම මසකම සිව්වන සතියේ සිකුරාදා |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 05)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 06. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මහ සභාව සඳහා නිර්දේශ හා උපදෙස් ලබා දීම මෙන්ම සභාව විසින් කලින් කලට පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීම සඳහා කාරක සභා උපදේශන කමිටු සාමාජිකත්වය සඳහා 25% කාන්තා නියෝජනය ලබා දීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ටී.ඉමල්කා සංජීවනි මැතිනිය** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 06)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 07. 2023 වර්ෂය සඳහා මහජන නියෝජිතයින් සහභාගිවන මහ සභා රැස්වීම්,විශේෂ මහ සභා රැස්වීම් සහ කමිටු රැස්වීම් සඳහා සංග්‍රහ වියදම් ලෙස එක් රැස්වීම් වාරයක දී රු.15000.00 ක උපරිමයකට යටත්ව සභා අරමුදලින් වියදම් දැරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 07)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 08. 2023 පළමු අර්ධ වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම හා 2023 වර්ෂයේ විගණන කළමනාකරන කමිටු රැස්වීම සඳහා සෑම කාර්තුවකම තෙවන මාසයේ හතරවන සතියේ බ්‍රහස්පතින්දා ,එදින නිවාඩු දිනයක් යෙදි ඇතිනම් ඊලග කාර්යාල වැඩ කරන දිනය යොදා ගැනිමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 08)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 09. 2023 වර්ෂය සඳහා යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු පුස්තකාලවල සංවර්ධනය හා කාර්යය කටයුතු විධිමත් කිරිම උදෙසා මහ සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරිම සඳහා 1988.08.23 සම්මත අතුරු ව්‍යවස්ථාවේ පුස්තකාල සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව වන අංක 36 දරන අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව පුස්තකාල උපදේශන කමිටුව නම් කිරිම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ඒ අනුව

| | |
|---|---|
| 01. ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා | 02.ගරු උප සභාපති ඒ.වි.රොහාන්ත ගුණසේකර මැතිතුමා |
| 03. ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි එම්.ඩී.පී.ඥානවති මැතිනිය | 04.ගරු ප්‍රා.ස.මන්ත්‍රිනි ඩයනා පාලමකුඹුර මැතිනිය |
| 05. එම්.ඒ.චන්ද්‍රපාල මහතා,කිතුල්ගල | 06.කේ.එම්.සෝමරත්න මහතා,හොරන්දල |
| 07.ඒ.ඩබ්.ඒ.සිරිවර්ධන මහතා,ගරාගොඩ | 08.දයානි චන්ද්‍රපාල මහත්මිය,අමනාවල |
| 09. කාන්ති ශ්‍යාමා මහත්මිය ,අමනාවල | |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඉහත නම් කරන ලද පුස්තකාල උපදේශන කමිටුව සුදුසු යැයි මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාවට අනුව නම් කරන ලද කමිටුව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 09)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 10. 2023 වර්ෂය සඳහා යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් සපයාගනු ලබන භාණ්ඩ හා සේවා වෙනුවෙන් තාක්ෂණික පිරිවිතර සකස් කිරිම හා තාක්ෂණික ඇගයීම් සිදු කරමින් ප්‍රසම්පාදන කමිටුව වෙත නිර්දේශ ඉදිරිපත් කිරිම උදෙසා 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති සංග්‍රහයේ 178(2) (8) (2) උප වගන්තිය ප්‍රකාරව හා 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගපදේශ සංග්‍රහයේ 2.8.5 සමඟ කියවිය යුතු ප්‍රසම්පාදන කාර්යය සංග්‍රයේ 29 වන පිටුවෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව පහත

සාමාජිකයින් තුන්දෙනෙකුගෙන් යුත් තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කිරිමට ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනිම සඳහා මා යෝජනා කරනවා.

1.කාර්යය මණ්ඩලයේ ජේෂ්ඨ නිලධාරි 01
2.කාර්මික නිලධාරි 01
3.ඒ ඒ භාණ්ඩයේ ස්වරූපය අනුව එකී විෂය පිළිබඳව ප්‍රවීණත්වය දරන ඊට අදාළ තනතුරක රාජකාරි ඉටු කරනු ලබන නිලධාරියෙකු ලෙස ආදායම් පරීක්ෂක, විදුලි අධිකාරි, මාර්ග සංවර්ධන වැඩ පරිපාලක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි, පොලිස් පරීක්ෂක අතරින් අයෙක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.කාර්යය මණ්ඩලයේ නිලධාරි ලෙස සංවර්ධන නිලධාරි චමිලා ගුණසේකර මහත්මියත්,කාර්මික නිලධාරි වෙනුවෙන් ඩබ්.ඒ.ජී.ඩී.කරුණාජීව මහතා/මොහාන් මහතා ,ඒ ඒ විෂය අනුව සාමාජිකයා තෝරා ගැනීම ප්‍රසම්පාදන කමිටුව විසින් නම් කිරිමත් සුදුසු බව මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු සංජීව මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද කමිටුව සුදුසු යැයි මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව කාර්යය මණ්ඩලයේ නිලධාරි ලෙස සංවර්ධන නිලධාරි චමිලා ගුණසේකර මහත්මියත්,කාර්මික නිලධාරි වෙනුවෙන් ඩබ්.ඒ.ජී.ඩී.කරුණාජීව මහතා/මොහාන් මහතා ,ඒ ඒ විෂය අනුව සාමාජිකයා තෝරා ගැනීම ප්‍රසම්පාදන කමිටුව විසින් නම් කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාවට අනුව කාර්යය මණ්ඩලයේ නිලධාරි ලෙස සංවර්ධන නිලධාරි චමිලා ගුණසේකර මහත්මියත්,කාර්මික නිලධාරි වෙනුවෙන් ඩබ්.ඒ.ජී.ඩී.කරුණාජීව මහතා/මොහාන් මහතා ,ඒ ඒ විෂය අනුව සාමාජිකයා තෝරා ගැනීම ප්‍රසම්පාදන කමිටුව විසින් නම් කිරිම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 10)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 11. 2023 වර්ෂය සඳහා යටියන්තොට ප්‍රාදේශිය සභාවට අවශ්‍ය වැඩ, භාණ්ඩ හා සේවා සම්පාදනය කිරිමේ දි සැපයුම් ක්‍රමවේදය තීරණය කිරිමට, මිල ගණන් විවෘත කිරිම, ලැබී ඇති මිල ගණන් අනුව හා අවශ්‍ය අවස්ථාවලදි තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව මිලදි ගැනිමට අදාල තීරණයට එළඹීම සඳහා 1988 මූල්‍ය හා පරිපාලන රිති සංග්‍රහයේ 178/1 හා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 23 වන පිටුවෙහි 2006.2.7.7. සමග කියවිය යුතු ප්‍රසම්පාදන කාර්යා සංග්‍රහයේ 23 වන පිටුවෙහි සඳහන් පරිදි පහත සාමාජිකයින් සමඟ මහ සභාව විසින් මේ අවස්ථාවේ නම් කරන මන්ත්‍රීන් දෙදෙනෙකුගෙන් සමන්විත සැදුම්ලත් ප්‍රසම්පාදන කමිටුව පත් කිරිමටත්, එහි ගණ පූර්ණය ලේකම් සහ සභාපති ඇතුලුව 03ක් ලෙස සැලකීමත් සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

01.ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති
02.ප්‍රාදේශීය සභාවේ ලේකම්
03.ආදායම් පරීක්ෂක හෝ කාර්මික නිලධාරි

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර්.ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි,ඒ යෝජනාව මා ස්ථිර කරනවා.ප්‍රසම්පාදන කමිටුවේ ගරු මන්ත්‍රීතුමන්ලා ලෙස ගරු ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා සහ ගරු ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා සුදුසුයැයි මා ප්‍රකාශ කර සිටිනවා.ඉදිකිරීම් කටයුතුවල තීරණ සඳහා කාර්මික නිලධාරි ද ,අනෙක් තීරණ සඳහා ආදායම් පරීක්ෂක තුමා සුදුසුයැයි ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු ලාල් මැතිතුමා නම් කරන ලද කමිටුව සුදුසුයැයි මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව නම් කරන ලද කමිටුව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් ප්‍රසම්පාදන කමිටුව සඳහා ගරු මන්ත්‍රීතුමන්ලා වශයෙන් ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා සහ ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා ඇතුළුව ප්‍රාදේශීය සභාවේ සභාපති,ලේකම් හා ආදායම් පරීක්ෂක මහතා හෝ කාර්මික නිලධාරි මහතා නම් කරන ලද අතර ප්‍රසම්පාදන තීරණ ගැනීමේ දී සභාපති,ලේකම් හා එක් සභික නියෝජිතයෙකු සමඟ තිදෙනෙකුගෙන් සමන්විතව කටයුතු කිරිම ගණපූර්ණය සහිත කටයුත්තක් සේ සැළකීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 11)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 12. 2023 වර්ෂයට අදාළව සකස් කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 12)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 13. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ එක් එක් මාසයේ අපේක්ෂිත ආදායම් වියදම් පිළිබඳ සැලැස්ම ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 13)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 14. 2023 වර්ෂය සඳහා සකස් කරන ලද ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම් සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 14)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 15. 2023 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික තිරසාර ක්‍රියාකාරි සැලැස්ම, කාර්යය සාධන සැලැස්ම, පුහුණු සැලැස්ම ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 15)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 16. ඇමුණුමේ සඳහන් විස්තරවලට අදාල වරිපනම් ලේඛනයෙහි සඳහන් හිමිකරුගේ නම, ආයතනය වෙත ඉදිරිපත් වූ හිමිකම් සංශෝධන අයදුම්පත්‍රය හා ආදායම් පරීක්ෂක මහතාගේ වාර්තාවට අනුව වරිපනම් ලේඛනයේ තොරතුරු නව හිමිකරු නමින් සංශෝධනය සභාව විසින් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මා යෝජනා කරනවා.

| අනු අංකය | කො.අ | පාර | වරි.අං | ලේඛනගත හිමිකරු | වර්තමාන හිමිකරු | වෙනත් විස්තර |
|---|---|---|---|---|---|---|
| 1 | 5 | කරවනැල්ල පාර වම | 71/15A | ඒ.එච් ලාසරස් | එන්.පී ලාසරස් | |
| 2 | 5 | කරවනැල්ල පාර වම | 71/6 | ඒ.ඒ.අයි මර්ලියා | එම්.ආර්.සාජහාන් | |
| 3 | 9 | යටියන්තොට පාර දකුණ | 22 | එස්.ඒ.එම් පියදාස | ජේ.ඒ.ඒ.ජයසූරිය | |
| 4 | 1 | පරුස්සැල්ල පාර වම | 81 | එම්.ඩබ්.පෙරේරා,මිහිරුන් නිසා | පරීද් නබීසා | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 5 | 2 | ගිණිගත්හේන පාර වම | 07,7 1/1 | රාජේස්වරි නඩරාජා | එම්.ආර්.නිලන්ත ප්‍රනාන්දු | 7, 7 1/1 දරණ දේපල අංක 7 ලෙස ඒකාබද්ධ කිරීම සුදුසුයි.(138 වගන්තිය) |
| 6 | 1 | කරවනැල්ල පාර දකුණ | 36 | කේ.වින්සන්ට් පෙරේරා | කේ.සුජිත් සංජය පෙරේරා | |
| 7 | 2 | පරුස්සැල්ල පාර දකුණ | 270/20 | යටියන්තොට ප්‍රාදේශීය සභාව හිකි එම්.කේ.ටී.එම්.පෙරේරා | යටියන්තොට ප්‍රාදේශීය සභාව හි.කි වත්තගේ සෝමාවති | |
| 8 | 8 | දෙගල්ලස්ස පාර වම | 41/2 | අයිතිකරු හිකි රූපවති | ඒ.මල්ලිකා | |
| 9 | 1 | කරවනැල්ල පාර දකුණ | 26/4 | මුස්තාපා හිකි පුෂ්පරාණි | අංගුසාමි සේගර් | |
| 10 | 9 | යටියන්තොට පාර දකුණ | 76 | එම්.සිමියොන් සිංඤෝ | එම්.ස්වර්ණා ශ්‍යාමලී | |
| 11 | 6 | කරවනැල්ල පාර වම | 179A | අයිතිකරු | කේ.ටී.යූ ප්‍රියන්ත | |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 16)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 17. GIS තාක්ෂණය මගින් මාර්ග සිතියම්ගත කිරීමේ වැඩසටහන යටතේ යටියන්තොට බල ප්‍රදේශයේ ප්‍රධාන මාර්ගවල සහ අතුරු මාර්ගවල ගමන් කිරීම සඳහා බහුකාර්යය සංවර්ධන පුහුණු සහයක කණ්ඩායම යොදාගන්නා අතර කාර්යය ඉටුකිරීම වෙනුවෙන් ඔවුනට දිනකට රු.700.00ට යටත්වූ සංයුක්ත දීමනා සහ/හෝ සේවයේ යොදවා ගන්නා සති අන්ත හෝ රජයේ නිවාඩු දින සඳහා රු.1300.00ක දෛනික දීමනා (PL වැටුප් බාන්ඩයේ ආරම්භක පියවර හා අදාල දීමනා) සභා අරමුදලින් ලබා දීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 17)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 18. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් වාහනවලට අදාළ රක්ෂණාවරණය අලුත්කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| අනු අංකය | ලියාපදිංචි අංකය | වාහන වර්ගය | වටිනාකම (ශ්‍රී.ල.රු) |
|---|---|---|---|
| 1 | WPLL 7733 | කෘ කැබ් රථය | 34,088.94 |
| 2 | WPLL 6433 | ටිපර් රථය | 69,315.86 |
| 3 | SGRD 8015 | ට්‍රැක්ටරය | 14,450.26 |
| 4 | SGRX 2003 | ජල බවුසරය | 11,527.92 |
| 5 | SGRE 2260 | ට්‍රැක්ටරය | 14,450.26 |
| 6 | WPZA 5057 | බැකෝ යන්ත්‍රය | 1,416.48 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී.පී.ඥානවති මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 18)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 19. මාස 07 කට ආසන්න කාලයක් මෙම ආයතනයේ ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානයේ ,ආයුර්වේද වෛද්‍ය නිලධාරි තනතුරේ රාජකාරි ආවරණය කළ පනාවල ආයුර්වේද රෝහලේ වෛද්‍ය වයි.ඒ කුමාරසිරි මහතාගේ සේවය අගයමින් සේවා ඇගයීම් සහතිකයක් නිකුත් කිරීම සඳහා වන යෝජනාව ගරු මහ සභාවේ අනුමැතිය මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ප්‍රේමසිරි ජයලත් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 19)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 20. යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මත්තමගොඩ පිහිටි පහත සඳහන් ඉඩම් වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| ඉඩමේ නම | පිඹුරු අංකය | පැවරුම්කරණයේ අංකය | ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|---|---|
| කණුකැටියේ වත්ත (ඩ්‍රීම් පාර්ක් 01) | 0414 | 141 | රූඩ් 01 පර්.25.04 | රු.100,000.00 |
| කණුකැටියේ වත්ත (ඩ්‍රීම් පාර්ක් 02) | 0415 | 140 | රූඩ් 02 පර්.07.08 | රු.100,000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් ප්‍රේමසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 20)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 21. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු RD 4349 දරන ට්‍රැක්ටරයේ අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් දායක මෝටර්ස් ගරාජයට රු.65,310.00 ක් ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී.පී.ඥානවති මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 21)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 22. යටියන්තොට පුරනැගුම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා මාසික කුලිය තක්සේරු කරමින් ප්‍රධාන තක්සේරුකරු විසින් ලබා දී ඇති අංක KE/RP/2030 දරන 2022.11.25 දිනැති තක්සේරු වාර්තාව 2023 ජනවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට ගරු මහා සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ටී.ඉමල්කා සංජීවනි මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 22)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 23. යටියන්තොට පොළහුමියේ ආදායම් පරීක්ෂක මහතුන් විසින් භාවිතා කල නමුත් දැනට නිති පතා භාවිතා නොකරන අඩි 14 x 14 ප්‍රමානයේ කඩ කාමරය ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා වෙළඳ ව්‍යාපාරයක් හෝ ගබඩාවක් වෙනුවෙන් යොදාගැනීමට හැකියාවක් පවතින බවට හඳුනාගෙන ඇත. ඒ සඳහා විධිමත් තක්සේරුවක් ලැබෙන තුරු මෙය ආදායම් පරීක්ෂකවරුන් ලබා දුන් මාසිකව රු. 6000.00 ක අවම ලංසු මුදල යටතේ ප්‍රාදේශිය මට්ටමින් ප්‍රචාරය කර ටෙන්ඩර් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.නමුත් මෙය රු.4000.00ක අවම ලංසුව තබා ටෙණ්ඩර් කිරිම සුදුසුයැයි මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලසික දෙයියාගල මැතිතුමා** ගරු සභාපතිතුමනි, රු.4000.00 ක අවම ලංසුව තබා ටෙණ්ඩර් කරමු.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව රු.4000.00 ක අවම ලංසුව තබා ටෙන්ඩර් කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් රු.4000.00 ක අවම ලංසුව තබා ටෙණ්ඩර් කිරිම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 23)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 24. යටියන්තොට නව සතිපොළ මාළු කඩය 2023 වර්ෂයට බදු දීමට මිල ගණන් කැඳවීම යටතේ ලද මිල ගණන් පත් 2022.12.02 දින පෙ.ව 10.30 ට සියලුම ලංසුකරුවන් ඉදිරියේ ප්‍රසම්පාදන කමිටුව විසින් විවෘත කරන ලදී.ඒ සඳහා ඉදිරිපත්ව තිබූ ලංසුකරුවන් හා ඔවුන්ගේ වටිනාකම් පහත පරිදි වේ .සියලුම ලංසු කරුවන් සුදුසුකම් ලත් ලංසුකරුවන් වේ.රු.2952000.00 ක වැඩිම ලංසු වටිනාකම සඳහා ටෙන්ඩරය පිරිනැමීම සුදුසු බවට ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය කර ඇත.මේ සම්බන්ධ ප්‍රසම්පාදන කමිටු තීරණය ස්ථිර කිරීම හෝ ප්‍රාදේශිය සභා පනතේ 174 වගන්තියට අවධානය යොමු කරමින් සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

| අනු අංකය | ටෙන්ඩර්කරුගේ නම | ඉදිරිපත් කර ඇති ලංසු මුදල රු. |
|---|---|---|
| 1 | එච්.ගුණසේන මහතා | 2,952,000.00 |
| 2 | එල්.එස්.සී ලියනාරච්චි මහතා | 2,152,800.50 |
| 3 | බී.ආර්.එන්.සුදර්ශි විජේසිංහ මිය | 1,817,700.50 |
| 4 | අයි.පී.එම් ප්‍රියංග අතුලසිරි මහතා | 1,413,180.50 |
| 5 | කේ.එස්.ඒ ප්‍රියන්ත මහතා | 1,263,599.00 |
| 6 | බී.ඒ දිල්කා පුෂ්පකුමාරි මිය | 990,451.75 |
| 7 | එම්.පී.එම් අහ්සාන් මහතා | 795,399.50 |
| 8 | බී.ආර්.එස්.ආර් මධුෂංග විජේසිංහ මහතා | 658,000.00 |
| 9 | කේ.කේ .ඒ. ඉරෝෂාන් ඥානතිලක මහතා | 500,500.00 |
| 10 | ඒ.එම් සිරියලතා ජයසිංහ මිය | 427,500.00 |
| 11 | කේ.ඒ.සී රුවන් ප්‍රදීප් කුමාර මහතා | 380,000.00 |
| 12 | ඩබ්.ආර්.ඒ වල්ගම මහතා | 335,000.00 |
| 13 | කේ.ජී රුමේෂ් නිලංක මහතා | 298,000.98 |
| 14 | වී.එම්.එස් මධුෂාන් වෙඳමුල්ල මහතා | 258,000.00 |

(ඉහත ඉදිරිපත් වූ ලංසු අතරින් එච්.ගුණසේන මයා, බී.ආර් නිසංසලා සුදර්ශි මිය, එල්.එස්.සී ලියනාරච්චි මයා යන අය පුද්ගලික හේතු ඉදිරිපත් කරමින් බදු ගැනිමේ කාර්යය සිදු කළ නොහැකි බව දිවුරුම් ප්‍රකාශ මගින් දන්වා ඇත.)

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ දිල්සානි ප්‍රසාදිකා මැතිනිය** ගරු සභාපතිතුමනි, මේ පිළිබඳව කරුණු දැන ගැනීමට අවශ්‍යයි.ඒ නිසා ගරු මහ සභාව කාරක සභාවක් බවට පත් කිරිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු මහ සභාව කාරක සභාවක් බවට පත් කිරිමේ යෝජනාව මා ස්ථිර කරනවා.

*.මහ සභාව පෙ.ව 11.10 කාරක සභාවක් බවට පත් විය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, කාරක සභාව මහ සභාවක් බවට පත් කිරිමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පි ප්‍රේමසිරි ජයලත් මැතිතුමා** ගරු සභාපතිතුමනි,කාරක සභාව මහ සභාවක් බවට පත් කිරිමේ යෝජනාව මා ස්ථිර කරනවා.

*.කාරක සභාව පෙ.ව.11.20 ට පමණ මහ සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, (ඉ) 24 යෝජනාවට අනුව ඉහළම මිල ලබා දුන් ලංසු කරුවන් තිදෙනාට දිවුරුම් ප්‍රකාශ මගින් ගිවිසුම්ගත වීමට නොහැකි බව දන්වා තිබූ නිසා (4) වන ලංසු වටිනාකම වන කේ.එස්.ඒ ප්‍රියන්ත මහතාට ලංසු වටිනාකමට ගිවිසුම්ගත වීමටත් ,ගිවිසුම්ගත වීමේදි මාස 06ක කුලී ආරක්ෂණ තැන්පතුව ලබා ගැනිමටත් එම අයද ගිවිසුම්ගත වීම ප්‍රතික්ෂේප කරයිනම් රු.50000.00 ක ලංසු ඇපකර මත නැවත ටෙණ්ඩර් කිරිමටත් ලංසු ඉදිරිපත් කර ගිවිසුම්ගත නොවූ ලංසුකරුවන් වාර්ෂික බදු දීම් සඳහා අසාදුලේඛන ගත කිරිමටත් සුදුසුයැයි මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි එච්.ඒ දිල්සානි ප්‍රසාදිකා මැතිනිය** ගරු සභාපතිතුමනි,ගරු සංජීව මන්ත්‍රිතුමා ඉදිරිපත් කළ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ඒ.ලසික දෙයියාගල මැතිතුමා** ගරු සභාපතිතුමනි, (ඉ) 24 යෝජනාව අනුව ගරු සංජීව මන්ත්‍රිතුමා ඉදිරිපත් කළ යෝජනාවට මා එකඟ වෙනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව (ඉ) 24 යෝජනාවට අනුව ඉහළම මිල ලබා දුන් ලංසු කරුවන් තිදෙනාට දිවුරුම් ප්‍රකාශ මගින් ගිවිසුම්ගත වීමට නොහැකි බව දන්වා තිබූ නිසා (4) වන ලංසු වටිනාකම වන කේ.එස්.ඒ ප්‍රියන්ත මහතාට ලංසු වටිනාකමට ගිවිසුම්ගත වීමටත් ,ගිවිසුම්ගත වීමේදි මාස 06ක කුලී ආරක්ෂණ තැන්පතුව ලබා ගැනිමටත් එම අයද ගිවිසුම්ගත වීම ප්‍රතික්ෂේප කරයිනම් රු.50000.00 ක ලංසු ඇපකර මත නැවත ටෙණ්ඩර් කිරිමටත් ලංසු ඉදිරිපත් කර ගිවිසුම්ගත නොවූ ලංසුකරුවන් වාර්ෂික බදු දීම් සඳහා අසාදුලේඛන ගත කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 24 යෝජනාව සඳහා ඉහළම මිල ලබා දුන් ලංසු කරුවන් තිදෙනාට දිවුරුම් ප්‍රකාශ මගින් ගිවිසුම්ගත වීමට නොහැකි බව දන්වා තිබූ නිසා (4) වන ලංසු වටිනාකම වන කේ.එස්.ඒ ප්‍රියන්ත මහතාට ලංසු වටිනාකමට ගිවිසුම්ගත වීමටත්, ගිවිසුම්ගත වීමේදි මාස 06ක කුලී ආරක්ෂණ තැන්පතුව ලබා ගැනිමටත් එම අයද ගිවිසුම්ගත වීම ප්‍රතික්ෂේප කරයිනම් රු.50000.00 ක ලංසු ඇපකර මත නැවත ටෙණ්ඩර් කිරිමටත් ලංසු ඉදිරිපත් කර ගිවිසුම්ගත නොවූ ලංසුකරුවන් වාර්ෂික බදු දීම් සඳහා අසාදුලේඛන ගත කිරිමටත් ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 24 )**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 25. 2023 වර්ෂය සඳහා වාර්ෂික බදුදීම්වලට මිල ගණන් කැඳවූ, නමුත් පළමු අවස්ථාවේදී මිල ගණන් ඉදිරිපත් නොවූ යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු කිතුල්ගල මාලු වෙළඳසැල, කිතුල්ගල කැළණි ගඟ ඔරු තොටුපල ඔරු පැදීමේ අයිතිය බදුදීම, යටියන්තොට පෙළ භූමිය පොදු වැසිකිලිය උඩ කොටස බදුදීම, පුර නැගුම වෙළඳ සංකීර්ණය අසල වාහන නැවතුම් ස්ථානය බදුදීම යන බදුදීම් පෙර අවම ලංසු මුදල යටතේම නැවත වරක් ටෙන්ඩර් කිරීමට සහ පුරනැගුම වෙළඳ සංකීර්ණයේ යටි මහල අංක 2, 3, 4 කඩ කාමර මාසික කඩකුලී යටතේ වාර්ෂික බදුදීම සහ පෙරගෙවුම් මුදල් ක්‍රමය යටතේ දීර්ඝ කාලීන බදුදීම යන අවස්ථා දෙක යටතේම ටෙන්ඩර් කර දීර්ඝ කාලීන බදුදීම සඳහා වැඩි ප්‍රමුඛතාවයකින් ටෙන්ඩර් පත් ඇගයීම සිදුකරමින් සුදුසු බදුකරුවන් තෝරාගැනීඹ සඳහා ටෙන්ඩර් කටයුතු ක්‍රියාත්මක කිරීමට සභාවේ අනුමැතිය ලබාගැනීම සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.පුරනැගුම කඩ කාමර මාසික හා පෙරගෙවුම් අවස්ථා දෙකටම මිල ගණන් කැඳවා ටෙණ්ඩර් ඇඟයීමේ දි පෙර ගෙවුම් මිලගණන් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී ඇඟයීම් කර බදුකරුවන් තෝරා ගැනීමට සුදුසුයැයි මා ප්‍රකාශ කර සිටිනවා.එසේම පළමු අවස්ථාවේ දි ටෙන්ඩර් නොවූ ස්ථාන තවත් අවස්ථාවක් ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කිරිම අනුමත කිරිම සුදුසු යැයි මා යෝජනා කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාවට අනුව පුරනැගුම කඩ කාමර සඳහා මාසික හා පෙරගෙවුම් අවස්ථා දෙකටම මිල ගණන් කැඳවා ටෙණ්ඩර් ඇඟයීමේ දි පෙර ගෙවුම් මිල ගණන් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී ඇඟයීම් කර බදුකරුවන් තෝරා ගැනීම හා පළමු අවස්ථාවේ දි ටෙන්ඩර් නොවූ ස්ථාන තවත් අවස්ථාවක් ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කිරිම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 25 යෝජනාව හා ඊට අදාළ පුරනැගුම කඩ කාමර මාසික හා පෙරගෙවුම් අවස්ථා දෙකටම මිල ගණන් කැඳවා ටෙණ්ඩර් ඇඟයීමේ දි පෙර ගෙවුම් මිලගණන් සඳහා වැඩි ප්‍රමුඛතාවයක් ලබා දී ඇඟයීම් කර බදුකරුවන් තෝරා ගැනීම හා පළමු අවස්ථාවේ දි ටෙන්ඩර් නොවූ ස්ථාන තවත් අවස්ථාවක් ටෙන්ඩර් කර බදු දීමට කටයුතු කිරිමට ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 25)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**
(ඉ) 26. 2023 වර්ෂය සඳහා පහත ඉඩම් බදු දීමට ඉදිරිපත්ව තිබූ මිල ගණන් පහත පරිදි වේ. ඒ අනුව ඉදිරිපත්ව තිබූ එකම ලංසු මුදල මත එම වටිනාකම් වලට දේපල බදු දීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| අනු අංකය | ස්ථානය | ලංසුකරුගේ නම | අවම ලංසුව(රු) | ලංසු වටිනාකම(රු) |
|---|---|---|---|---|
| 01. | ගරාගොඩ ගලපල්ලවත්ත ඉඩම බදු දීම | එම්.එල්.කරුණාපාල මහතා | 1100.00 | 1200.00 |
| 02. | බලවත්තොට ඔවිටේවත්ත ඉඩම බදු දීම | එම්.ඒ.වසන්ත කුමාර මහතා | 12000.00 | 12100.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ආර් ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව සඳහා වාර්ෂික බදු ලබා දීම නිසා වගාවන් පවත්වාගෙන යාමට අපහසු හා වැඩි ප්‍රතිලාභයක් නොමැති නිසා රජයේ ආහාර සුරක්ෂිත වැඩසටහනට ද දායක විය හැකි වගාවන් ක්‍රියාත්මක කිරීම පිණිස වර්ෂ 03 ක කාලයකට බදු දීම සුදුසු බව යෝජනා කරන අතර මෙය නැවත ටෙණ්ඩර් කරන ලෙස ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ලාල් මන්ත්‍රීතුමාගේ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, වර්ෂ 03කට බදු දීම සුදුසුයි.මේ වතාවේ ලංසු ඉදිරිපත් කර ඇති අයට ගාස්තු අය නොකර ලංසු ලියවිලි ලබා දීම සුදුසු යැයි මා ප්‍රකාශ කර සිටිනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සඳහා වාර්ෂික බදු ලබා දීම නිසා වගාවන් පවත්වාගෙන යාමට අපහසු හා වැඩි ප්‍රතිලාභයක් නොමැති නිසා රජයේ ආහාර සුරක්ෂිත වැඩසටහන ද දායක විය හැකි වගාවන් ක්‍රියාත්මක කිරීම පිණිස වර්ෂ 03 ක කාලයකට බදු දීම සුදුසු බව යෝජනා කරන අතර මෙය නැවත ටෙණ්ඩර් කිරීමේ දි පළමු වතාවේ දී ලංසු ඉදිරිපත් කළ අයට ගාස්තු අය නොකර ලියවිලි ලබා දීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් (ඉ) 26 යෝජනාව වාර්ෂික බදු ලබා දීම නිසා වගාවන් පවත්වාගෙන යාමට අපහසු හා වැඩි ප්‍රතිලාභයක් නොමැති නිසා රජයේ ආහාර සුරක්ෂිත වැඩසටහන ද දායක විය හැකි වගාවන් ක්‍රියාත්මක කිරීම පිණිස වර්ෂ 03 ක කාලයකට බදු දීමේදි පළමු වතාවේ දී ලංසු ඉදිරිපත් කළ අයට ගාස්තු අය නොකර ලියවිලි ලබා දීම සුදුසු බව යෝජනා කරන අතර මෙය නැවත ටෙණ්ඩර් කිරීම ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 26)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 27. 2023 වර්ෂයට අදාල තක්සේරු දැන්වීම් (k form) පරීක්ෂා කිරීම, බෙදාහැරීම හා 2023 වර්ෂයට අදාල ලේඛන ලිවීම වෙනුවෙන් CLG/LG/1/5/2018/14 අංක දරන ප.ප.කො.චක්‍රලේඛයට අනුව ගෙවීම් කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 27)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ)28. යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ළිං සම්බන්ධයෙන් වාර්ෂික මූල්‍ය,ප්‍රකාශන තුළ පවතින අගය සහ ඔප්පු වටිනාකම අතර පරස්පරතාවයක් පවතින බව විගණන අංශවල පෙන්වාදීම් අනුව හඳුනාගෙන ඇත.ඒ අනුව දැනට ගිණුම්ගත ළිං වටිනාකම වන රු 21,500.00 ක අගය ඉවත් කිරීමටත්, ඇමුණුම් අංක 01 හි දෙවන තීරුවේ සහ තෙවන තීරුවේ පරිදි ඔප්පුවේ සඳහන් නාමය සහ ඔප්පු වටිනාකම වන රු.19,800.00 ක සංශෝධිත වටිනාකම ගිණුම්ගත කිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.එස්.ඩබ්.රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාවට අනුව අවසන් ගිණුම් යාවත්කාලීන හා ස්ථාන විධිමත් කිරීම සඳහා කටයුතු කිරීමට ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 28)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 29. 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටු කරන ලද කර්මාන්තවල බිල්පත් වටිනාකම ගෙවීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| | |
|---|---|
| 01.ජයවින්දාගම ආනන්ද මහතාගේ නිවස අසලින් ක්‍රීඩා පිටිය දෙසට පිවිසෙන මාර්ගය සංවර්ධනය කිරීම ( සංශෝධිත ) | - රු 150,000.00 |
| 02.මීගස්තැන්න නො 05 මාර්ගය සංවර්ධනය කිරීම | - රු.150,000.00 |
| 03.ගල්පාත කඹුළුමුල්ල බෙරවල්දෙණිය මාර්ගයේ K.G අබේවර්ධන මහතාගේ නිවස අසල මාර්ගය සංවර්ධනය කිරීම | - රු.150,000.00 |
| 04.අමනාවල තෙලුන්නාව මාර්ගය කොන්ක්‍රීට් කිරීම | - රු.100,000.00 |
| 05.කලටුවාව කාබනික පොහොර මධ්‍යස්ථානයේ පොහොර හලන ස්ථානය අසල කොන්ක්‍රීට් කිරීම | - රු.253,000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සුදර්ශන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 29)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 30. සභාවේ සේවයේ නියුතු පහත සඳහන් අයවලුන් විසින් ආපදා ණය මුදලක් ඉල්ලුම් කර ඇත. එම මුදල සභා අරමුදලින් ගෙවීම් කිරීම සඳහා මා යෝජනා කරනවා.

| | |
|---|---|
| 1.එස්.රංජන් මහතා | - රු.40000.00 |
| 2.බී.එච්. දුෂාන්ත කුමාර මහතා | - රු.30000.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී.පී.ඥානවතී මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 30)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා**

(ඉ) 31. යටියන්තොට ප්‍රාදේශීය සභාව සතු ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ඖෂධ වර්ග ඇම්.ඩී.ලිවේරිස් අමරතුංග සහ පුත්‍රයෝ ආයතනය වෙතින් සපයා ගැනීම වෙනුවෙන් රු.142000.00 ක බිල්පත ගෙවීම් කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 31)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 32. යටියන්තොට ප්‍රාදේශීය සභාව විසින් කලකට පෙර ක්‍රියාත්මක කරන ලද සතිපොළ එළවළු කඩය හා සතිපොළ කුකුල් මස් කඩය ක්‍රියාත්මක නොවීමෙන් ආදායම් අහිමිවීමක් සිදුව ඇති බව ජාතික විගණන කාර්යාලයේ විමසීම් අංක kG/B/YPS/2022/AQ/15 (i) විගණන විසඳුම මගින් පෙන්වා දී ඇත.එම නිසා එම විගණන විමසුම ආදායම් උපයා ගැනීමට ඇති හැකියාව,වෙළඳපොල අවශ්‍යතාවයන් සහ තවත් සලකා බැලිය යුතු අවශ්‍යතාවයන් සලකා බලා එම ව්‍යාපාර ස්ථාන සහා දේපලක් හරහා ක්‍රියාත්මක කිරීමට හෝ නොකිරීමට සුදුසු තීරණයක් ලබා ගැනීම සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම් නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව ව්‍යාපාර ආදායම් මාර්ග වුවත් ප්‍රදේශයේ ජනතාවගේ සහ ආගමික ස්ථානවල ඉල්ලීම් සළකා මීට පෙර ලබා ගත් තීරණ එලෙස ක්‍රියාත්මක කිරීමට එනම් නැවත තීරණය කරන තුරු බදු දීම් නොකිරීමට සුදුසු යැයි මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම් සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, නන්දසේන මැතිතුමාගේ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව ව්‍යාපාර ආදායම් මාර්ග වුවත් ප්‍රදේශයේ ජනතාවගේ සහ ආගමික ස්ථානවල ඉල්ලීම් සළකා මීට පෙර ලබා ගත් තීරණ එලෙස ක්‍රියාත්මක කිරීමට එනම් නැවත තීරණය කරන තුරු බදු දීම් නොකිරීමට සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ව්‍යාපාර ආදායම් මාර්ග වුවත් ප්‍රදේශයේ ජනතාවගේ සහ ආගමික ස්ථානවල ඉල්ලීම් සළකා මීට පෙර ලබා ගත් තීරණ එලෙස ක්‍රියාත්මක කිරීමට එනම් නැවත තීරණය කරන තුරු බදු දීම් නොකිරීමට ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා.

**(සභා තීරණ අංක 33)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 33. රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2022.12.15 දිනැති චක්‍රල්බ අංක 2022/01 අනුව වයඹ සංවර්ධන අධිකාරිය විසින් පළාත් පාලන ආයතන සඳහා හඳුන්වාදෙනු ලැබූ CAT 2020 පරිගනක මෘදුකාංගය මෙම සභා කාර්යාලයේ කටයුතු සඳහා යොදා ගැනීමටත් ඒ සඳහා වියදම් සභා අරමුදලින් සිදුකිරීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 33)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 34. 2022 වර්ෂයේ ප්‍රාදේශිය සභා අරමුදල් යොදවා ඉටු කිරීමට යෝජනා කරන ලද පහත ව්‍යාපෘති වලට අදාළ ඇස්තමේන්තු සඳහා අනුමැතියත් අනුමත සමිතියක් මගින් ඉටු කිරීමටත් වැඩ අවසන් වූ පසු බිල්පත් ගෙවීමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

| | |
|---|---|
| 01.මත්තමගොඩ ලියන්ගහමුල හේන මාර්ගය කොන්ක්‍රීට් කිරීම (සංශෝධිත) | - රු.150,000.00 |
| 02.මත්තමගොඩ ලියන්ගහමුල රබර් මෝල මාර්ගය කොන්ක්‍රීට් කිරීම (සංශෝධිත) | - රු.50,000.00 |
| 03. ගෝණගමුව මිණිගම්මන මාර්ගය පාසල අසල පැති බැම්ම ඉදි කිරීම (1 අදියර) සංශෝධිත ඇස්තමේන්තුව | - රු.1,500,000.00 |
| 04. ඉහල වටගල ගලපල්ලවත්ත මාර්ගය බෝක්කුව සංවර්ධනය කිරීම (සංශෝධිත) | - රු.150,000.00 |
| 05.අදාහනාගාරයේ ආදාහන කුටියේ හදිසි අලුත්වැඩියා කිරීම | - රු.100,000.00 |
| 06.පොළ අභ්‍යන්තරය වතුර බැසයාම් විධිමත් කිරීම | - රු.150,000.00 |
| 07.ආදාහනාගාරයේ චිමිණිය දෙවන කොටස කපරාදු කිරීම | - රු.215,064.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 34)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා ඔබගේ යෝජනාව ඉදිරිපත් කරන්න

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.නිමල් කුමාරසිරි මැතිතුමා** (ඉ) 35 . බල ප්‍රදේශයේ පාසල් සිසුන් ආර්ථික දුෂ්කරතාවයකට මුහුණ දී ඇති බැවින් ඔවුන්ගේ පාසල් අවශ්‍යතාවය සපයා ගැනිමට නොහැකි තත්වයක් ඇති වී තිබේ.ඒ සඳහා සහනයක් ලෙස සභා අරමුදලින් වියදම් දරා දරුවන් වෙත අභ්‍යාස පොත් ලබා දීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා. මේ අවස්ථාවේ දරුවන්ව පාසල් යවන්න අමාරුයි.අඩු ආදායම් ලාභි පවුල් බලලා කොන්දේසි වලට යටත්ව අභ්‍යාස පොත් ලබා දෙමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජී.තිලකරත්න මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒක හොඳ යෝජනාවක් පොල්පිටිය වසමෙත් ගොඩක් දුප්පත් අසරණ පවුල් ඉන්නවා ඒ අයට බලලා දෙමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.සත්‍යානන්දන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, මෙය ඉතා හොඳ යෝජනාවක් මේක යම් ක්‍රමවේදයකට අඩුආදායම්ලාභී පවුල්වලට ලබා දෙමු.

**ගරු උප සභාපති ඒ.වී.රොහාන්ත ගුණසේකර මැතිතුමා** ගරු සභාපතිතුමනි, මේක අපි ප්‍රායෝගිකව විසඳගන්න පුළුවන් විදිහක් බලමු. අපට යෙදවිය හැකි මුදල් ප්‍රමාණයෙත් යම් සීමාවක් තියෙනවා.ඒවා පාසල් මට්ටමින් හෝ පන්ති මට්ටමින් තීරණය කරලා දෙමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, මේ යෝජනාව හොඳයි නමුත් මේ සඳහා පොදු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර යුතුයි. ගුරුවරු දන්නවා. එම දරුවන්ට බෙදා දීම සඳහා දුප්පත් ළමයා කවුද කියලා පාසල් මට්ටමින් පොත් දරුවන්ගේ නම් ලැයිස්තුවක් අරන් දුන්නනම් මෙය සාර්ථක කරගන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩයනා පාලමකුඹුර මැතිනිය** ගරු සභාපතිතුමනි, යටියන්තොට කොට්ඨාශයේ පාසල් කොපමණ තියෙනවා ද ඒහි ළමයි කොපමණ ඉන්නවාද කියලා බලලා වඩාත්ම දුෂ්කර පාසල් තෝරාගෙන යම් ක්‍රමවේදයක් හදලා මේක ක්‍රියාත්මක කරමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, මේ යෝජනාව හොඳයි.නමුත් යෝජනාව ඉදිරිපත් කරනකොට ඒක ක්‍රියාත්මක කරන නිර්ණායක ගේන්න ඕන .සභාවේ ඉල්ලුම් පත්‍රයක් සකස් කරලා මේ නිර්නායක වලට අදාලව දරුවන් තෝරා ඉදිරිපත් කරන්න කියලා පාසල් වලට ලිපි යවමු. යම් ක්‍රමවේදයක් හදලා මේක ක්‍රියාත්මක කරමු.

**ගරු සභාපති ලසික දෙයියාගල මැතිතුමා** ගරු සභාපතිතුමනි, නිමල් කුමාරසිරි මැතිතුමාගේ යෝජනාව හොඳ යෝජනාවක් ,සමස්ථයක් වශයෙන් 05 න් පහළ පන්තිවලට හරි මේක දෙමු.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සඳහා පලාත් පාලන කොමසාරිස් තුමා අපට නිර්නායක ටිකක් ඒවලා තියෙනවා. අපි ඒ අනුව කටයුතු කළ යුතුයි. ඒ අනුව මෙම වැඩසටහන තෝරාගත් පාසල් සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් සඳහා පලාත් පාලන කොමසාරිස් තුමා අපට නිර්නායක ටිකක් ඒවලා තියෙනවා. අපි ඒ අනුව කටයුතු කළ යුතුයි. ඒ අනුව මෙම වැඩසටහන තෝරාගත් පාසල් සඳහා යොදා ගැනීමට ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා **(සභා තීරණ අංක 35)**

.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 36. පළාත් පාලන අමාත්‍යාංශයේ යෝජනාවක් අනුව පළාත් පාලන ආයතනවල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන CAT 2020 මෘදුකාංගයට මෙම කාර්යාලයේ වරිපනම් තොරතුරු ඇතුලත් කිරීම සඳහා වෘතිය පුහුණු අධිකාරියෙන් පුහුණුව ලැබූ පුහුණු ලාභීන් දෙදෙනෙකු යොදාගෙන ඔවුන්ට දෛනික දීමනා ලෙස එක් අයෙකුට රු.750.00ක් සභා අරමුදලින් ගෙවීම් කිරීමට යටත්ව දෙදෙනෙකුගේ සේවය ලබා ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ඩී.පී .ඥානවති මැතිනිය** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 36)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 37. පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ 03/2020 හි 7 වගන්තිය සැලකිල්ලට ගෙන සභාව සතු පෙර ගෙවුම් තැන්පත් මුදලින් රු.5,539,436.47 ක් 2022 වාර්ෂික ආදායමට ගෙන සහ 2022 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා ලැබී ඇති රු.4,047,107.30ක ස්ථාවර තැන්පත් පොළී ආදායම පහත වැය ශීර්ෂවලට ප්‍රතිපාදන සලසමින් 2022 අයවැය හා ඒකාබද්ධ කරමින් පරිපූරක ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 168 (3) වගන්තිය අනුව ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමට මා යෝජනා කරනවා.

| ආදායම් | යෝජිත වැය විස්තරය |
|---|---|

| විස්තරය | පෙර ගෙවුම් වටිනාකම 50% /අතිරික්ත ආදායම | වටිනාකම | වැය ශීර්ෂය | වැය විෂය | ඇස්තමේන්තු වටිනාකම |
|---|---|---|---|---|---|
| බස්නැවතුම්පොල 3.84 | 91,800.00 | 91,800.00 | 309(7) | ඉඩම් වැඩිදියුණු කිරීම හා ගොඩනැගිලි | 5,261,543.77 |
| පොදු වෙළඳපොල 3.84 | 529,200.00 | 529,200.00 | 509(2) | ඉඩම් වැඩිදියුණු කිරීම හා ගොඩනැගිලි | 50,000.00 |
| පුරනැගුම යටි මහල -3.84 | 1,266,615.50 | 1,266,615.50 | 109 (2) | පරිගණක | 800,000.00 |
| පුරනැගුම බිම් මහල - 3.84 | 5,179,949.82 | 3,651,820.97 | 101(2) | අතිකාල හා නිවාඩු දින වැටුප් | 100,000.00 |
| ස්ථාවර තැන්පත් ආදායම - 1.61 | 4,047,107.30 | 4,047,107.30 | 102(1) | ගමන් වියදම් | 100,000.00 |
| | | | 107(1) | සහනාධාර | 2,000,000.00 |
| | | | 203(2) | ඉන්ධන හා ලිහිසි තෙල් | 1,000,000.00 |
| | | | 301(1)2 | වැටුප් හා දීමනා | 135,000.00 |
| | | | 304(1) | අළුත්වැඩියා හා නඩත්තු | 100,,000.00 |
| | | | 604(1) | ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියාව හා නඩත්තුව | 40,000.00 |
| | | 9,586,543.77 | | | 9,586,543.77 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් කුමාරසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 37)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 38. 2022 වර්ෂයේ දී සභා අරමුදලට අදාළ වන ණය හිමි වෙන් කිරීම 2023 ජනවාරි මස ගරු මහ සභාවේ ආවරණ අනුමැතියට යටත්ව සිදු කිරීමට ගරු සභාපති කේ.ඩී.වසන්ත මහතාට ප්‍රාදේශිය සභා පනතේ 08 වන වගන්තිය අනුව බලය පැවරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒස්.සුදර්ශන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 38)**

## හදිසි යෝජනා

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** **(ඉ) 39.** යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් වාහන හා යන්ත්‍රෝපකරණවලට අවශ්‍ය ඉන්ධන සපයා ගැනීම වෙනුවෙන් 2022 නොවැම්බර් මාසයට අදාළව යටියන්තොට විවිධසේවා සමුපකාර සමිතිය විසින් ඉදිරිපත් කර ඇති රු. 689,857.15 ක බිල්පත සහ 2022 දෙසැම්බර් මාසය සඳහා යටියන්තොට විවිධ සේවා සමුපකාර සමිතියෙන් ඉදිරිපත් වීමට නියමිත බිල්පත (රු.700.000.00 පමණ) සභා අරමුදලින් නිරවුල් කිරීම සඳහා සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.
සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 39)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 40 .** 2022 වර්ෂයේ ප්‍රාදේශීය සභා අරමුදල් යොදවා ඉටුකරනු ලබන පහත ව්‍යාපෘතියට අදාළ 1 වන කොටස් බිල්පත් වටිනාකම ගෙවීම් කිරිම සඳහා අනුමැතිය ලබා ගැනිමට මා යෝජනා කරනවා .

01. යටියන්තොට ප්‍රාදේශීය සභා ක්‍රිඩාංගනය සංවර්ධනය කිරිම - රු. 1,219,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජේම් නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 40)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** (ඉ) 41. පහත ව්‍යාපෘතියට අදාලව ඇස්තමේන්තුව සඳහා අනුමැතියක් අනුමත සමිතියක් මගින් ඉටු කිරිමටත් ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා

**01.** යටියන්තොට මාළු වෙළඳසැල ඉදිකිරිම - රු. 2,500,000.00

02 .මලල්පොල පිදුරුවැල්ල බෝක්කුව සංවර්ධනය කිරිම - රු. 150,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 41)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 42.** යටියන්තොට ප්‍රාදේශිය සභාවේ පොදු වෙළඳපල කඩ කාමර අංක 20 A සඳහා 2020.10.13 දින මහ සභා යෝජනාව අනුව පත්කල කමිටුවේ නිර්දේශ හා එය සලකා බලනු ලැබූ 2021.05.11 දිනැති ගරු මහා සභා තිරණ අංක 17 අනුව මෙම කඩ කාමරයට 2018 සැප්තැම්බර්,ඔක්තෝබර්,නොවැම්බර් මාස 03 සඳහා රු.8000.00 බැගින් රු.24000.00 ක මාසික බදු මුදල හා ඊට අදාල රු.4800.00 ක් වන දඩ මුදල සඳහා කඩ කුලී සහනයක් ලබා දීමට අනුමතව ඇති හෙයින්,එම රු.24000.00 මාසික බදු මුදල හා රු.4800.00 ක දඩ මුදල 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 182 වගන්තිය අනුව ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යටත්ව ආදායමින් අත්හැරීම සඳහා සහ සහන ලබා නොදුන් අවස්ථාවේදි සිදු කල ගණනය කිරීම් අනුව දැනට ලේඛන ගතව ඇති අගයන් නිවැරදි කර ගැනීම සඳහා ගරු මහ සභාවේ අනුමැතිය මා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජේම් . නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 42)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 43.** 2022 වර්ෂයේ ප්‍රාදේශිය සභා අරමුදල් යොදවා ඉටු කරන ලද කර්මාන්ත වල බිල්පත් වටිනාකම ගෙවීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා **මා යෝජනා කරනවා.**

**01.** පහල ගරාගොඩ පේර කොටුව මාර්ගය සංවර්ධනය කිරිම - රු.150,000.00

**02.** දෙගල්ලස්ස **පහල කොටස අළුත් කොළණිය මාර්ගය සංවර්ධනය කිරිම -** රු. 150,000.00 .

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒස්.සුදර්ශන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 43)**

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා (ඉ) 44.** ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන 2021 යටතේ ඉටු කරන ලද පහත කර්මාන්ත වලට අදාළව බිල්පත් වටිනාකම ගෙවීමට අදාළව ග්‍රාමීය මාර්ග සංවර්ධන රාජ්‍යය අමාත්‍යාංශ අධ්‍යක්ෂ (සැලසුම් ) විසින්

ඉදිරිපත් කරන ලද චෙක්පතේ වටිනාකම අදාළ කොන්ත්‍රාත් සමිති වෙත ගෙවීම් කිරීමට ගරු මහ සභාවේ අනුමැතිය සඳහා මා යෝජනා කරනවා.

01.පොල්කොටුව මාර්ගය සංවර්ධනය කිරීම - රු.885,651.40
02.මහවිල නව ගම්මාන මාර්ගය සංවර්ධනය කිරීම - රු.704,333.47
03.වෙරළුගොල්ල මාර්ගය සංවර්ධනය කිරීම - රු.893,306.10
04.මත්තමගොඩ බණ්ඩාරවත්ත මාර්ගය සංවර්ධනය කිරීම - රු.890,492.76

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ඒම්.ඒස්.ඩබ් රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු සභාපති කේ.ඩී.වසන්ත මැතිතුමා** ඉහත යෝජනාව සම්බන්ධයෙන් සභාවේ අදහස් දැක්වීමක්,විරුද්ධත්වයක් හෝ සංශෝධනයක් ඇත්නම් ඒ බව ප්‍රකාශ කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

සභාවේ නිහඬතාවය හේතුවෙන් විරුද්ධත්වයක් නොමැති බව මම ප්‍රකාශ කරනවා.එබැවින් එම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ බව නිවේදනය කර සිටිනවා. **(සභා තීරණ අංක 44)**

**(ඊ) කාරක සභා වාර්තා සළකා බැලීම**

* විගණන අධිකාරිගේ කර්මාන්ත පරික්ෂාව 2022 මැයෙන් යුතු KGL/B/YPS/2022/AQ/15(iii) හා 2022 නොවැම්බර් 30 දිනැති විගණන විමසුම
* විගණන අධිකාරිගේ ආදායම් පරික්ෂාව 2022 මැයෙන් යුතු KGL/B/YPS/2022/AQ/15( i ) හා 2022 නොවැම්බර් 30 දිනැති විගණන විමසුම

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ එකතු කළ ආදායම් පිළිබඳ මාසික වාර්තා**

01 .2022 නොවැම්මිබර් මාසයට අදාල වියදම් වාර්තාව
02. 2022 නොවැම්බර් මාසයට අදාල ආදායම් වියදම් වාර්තාව
03. 2022 නොවැම්බර් මාසයට අදාල ආදායම් ප්‍රගති වාර්තාව
04. 2022 නෙවැම්බර් මාසයට අදාල අපේක්ෂිත සත්‍ය අදායම් හා වියදම් වාර්තාව

**(ඌ) වෙනත් කරුණු**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නිමල් විජේසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා තව දුරටත් රටේ රාජ්‍ය නායකයා විය යුතුයි .රාජපක්ෂ ආණ්ඩුව කාලේ රටේ විශාල ලෙස ප්‍රශ්ණ ගොඩක් තිබුණා .නමුත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඒවාට යම් තරමක විසඳුම් ලබා දුන්නා.යම් තරමක මිනිස්සු පාලනය වුණා. ඒ නිසා අපේ රටේ සාමය හා නීතිය ආරක්ෂා කරන්න පුළුවන් වුනා. පක්ෂවලට නැවෙන්නැතිව අපි හැමෝම රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වය යටතේ ඉදිරියටත් සිටීමට බලාපොරොත්තු වෙමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒච්.ඒ.ප්‍රියන්ත පුෂ්පකුමාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තියෙන්නේ රටේ ජනතාව විසින් තමයි ජනාධිපති පත් කළ යුතුයි කියලා නමුත් මේ ජනාධිපති පත් කරන්නේ පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු ඒකතුවෙලා .මේ ගොල්ලන් ආන්ඩුක්‍රම ව්‍යවස්ථාවවත් ආරක්ෂා කරලා නෑ. දැන් රටේ ණය ගෙවන්නේ නෑ .ඒ ණය වලින් තමයි රට දුවන්නේ ,ඉදිරියේ දි රට ආගාධයට පත් වෙනවා. මේ රටේ ටික ටික කොටස් විකුණනවා.මේ දරුවන්ට රටක් ඉතිරි කරන්න ඉඩ දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒම්.කේ.කේ.සංජීව අබේකෝන් මැතිතුමා** ගරු සභාපතිතුමනි, රට මේ තත්වයට පත් කළ ඒකට අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ අවුරුද්දේ පමණක් නොවෙයි ලඟ අවුරුදු 05 ත් ජනාධිපති වෙනවා. කව්රුත් භාර නොගන්ත වෙලාවේ මේ රට භාර ගත්තා. කාටවත් චෝදනා කරලා වැඩක් නෑ .මේ රට අරගන කරන්න පුළුවන් කෙනෙක් ඉන්නවානම් අරගන කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කතිකා දමයන්ති මැතිනිය** ගරු සභාපතිතුමනි, අපේ සීපෝත් මාර්ගය ඉතා අබලන් තත්වයේ තියෙන්නේ, නමුත් දැන් ඒක පිලිසකර කරන්න ජනාධිපතිතුමාට යොමු කරලා ගරු රංජිත් සියඹලාපිටිය මැතිතුමා මේ සඳහා දායකත්වය දැක්වුවා ඒකට මා ස්තුතිය පුද කර සිටිනවා.

- ගරු සභාතිතුමා සිරිවර්ධන පාසලේ දෙමළ උගන්වන්න ගුරුවරයෙක් නෑ. ඒගැනත් පොඩ්ඩක් අවධානය යොමු කරන්න.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.ඒම්.ඒස්.ඩබ් රාජපක්ෂ බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ කාල සීමාව තුල මත්තමගොඩ වසමට කුණු ට්‍රැක්ටරය ඒවුවා ඒකට ගොඩක් ස්තුතියි.ඉදිරියේදි ඒය ඉටු කරලා දෙන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී හිමන්ත අජිත් බණ්ඩාර මැතිතුමා** ගරු සභාපතිතුමනි, සීපෝත් නතරයේ වැඩ අවසන් කරන්න කටයුතු යොදාගෙන තියෙනවා ඒ වගේම අමනාවල රෝහලට ගිලන් රථයක් ලබා දෙනවා මේ දසහා ඇපකැප වුණු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මන්ගලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. තවද අපේ ප්‍රදේශයේ මත්ද්‍රව්‍ය වැඩිවෙලා තියෙනවා පොලිස් ස්ථානයක් සීපෝත් වසමේ ආරම්භ කරන්න කටයුතු සලසා දෙන්න පුළුවන්නම් හොඳයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රේමසිරි ජයලත් මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගල්පාත වසමට විශාල සේවයක් කළා .නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවක් ආරම්භ කළා. වසමේ සංවර්ධන වැඩසටහන් වගේම දැනුවත් කිරිමේ වැඩසටහන් ජංගම සේවා කළා. මේ දසභා දායක වූ සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමා ඇතුළු කාර්යය මණ්ඩලයටත් බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සරත් ප්‍රේමසිරි මැතිතුමා** ගරු සභාපතිතුමනි, තම තමන්ගේ කොට්ඨාශ නියෝජනය කරන සියළුම මන්ත්‍රීවරුන්ටත් ජනතාවටත් සියළු කාරණා ඉෂ්ඨ සිද්ද වෙන් සුහම සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනවා.

**01.නොපැමිණි ගරු මන්ත්‍රීතුමන්ලාගේ නිවාඩු අනුමත කිරිම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ජ්ම්.නන්දසේන වික්‍රමසූරිය මැතිතුමා** ගරු සභාපතිතුමනි, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කීර්තිසේන අල්විස් මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණීමට නොහැකි බව දන්වා සිටිනවා.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල හේමන්ත මැතිතුමා විදේශ ගත වී ඇති බැවින් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇත. එබැවින් අද දින නිවාඩු ලබා දෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති කේ.ඩි.වසන්ත මැතිතුමා** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කීර්තිසේන අලිවිස් මැතිතුමා අසනීප වීම නිසා අද දින සභාවට පැමිණීමට නොහැකි බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල හේමන්ත මැතිතුමා කලින් දන්වා විදේශ ගත වී ඇති බැවින් සභාවට පැමිණීමට නොහැකි බව දන්වා ඇත. ඒබැවින් අද දින නිවාඩු අනුමත කරන බව ගරු මහ සභාවට මා දන්වා සිටිනවා

**02.ගරු මන්ත්‍රීතුමන්ලාගේ අදහස් දැක්වීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලාල් නිශාන්ත මැතිතුමා** ගරු සභාපතිතුමනි, දඩාවතේ යන බල්ලන් ඉන්නවා.එයාලගෙන් ජනතාවට කරදරයි.සෞඛ්‍ය බලධාරින් දැනුවත් කරන්න.

***සභාපතිතුමාගේ ස්තුති කථාව**

ලබන්නා වූ 2023 නව වසර සියළුම දෙනාට සුභ නව වසරක් වේවා කියා ප්‍රාර්ථනා කරනවා. අද දින සභාවේ කටයුතු සාර්ථක කර ගැනිමට හැකි වීම පිළිබඳව ගරු මන්ත්‍රී මණ්ඩලයටත්, කාර්යය මණ්ඩලයටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින් ප.ව 1.15 ට පමණ මහ සභා රැස්වීම අවසන් කරන ලදි